අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு 'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
Ministry of Education, Higher Education and Vocational Education 'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ යොමුව<br>எனது இல.<br>My Ref. | ED/1/1/5/14 | ඔබේ යොමුව<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2024. 11. 29 |

චක්‍රලේඛ අංකය: 36 / 2024

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම විදුහල්පතිවරුන්

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒකාබද්ධව ටවර් හෝල් රඟහල පදනම විසින් 30 වැනි වරට සංවිධානය කරනු ලබන සමස්ත ලංකා පාසල් නාට්‍ය තරගාවලිය - 2024/2025**

**01 හැඳින්වීම:**

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒකාබද්ධව ටවර් හෝල් රඟහල පදනම විසින් නූර්ති නාට්‍ය කලාවේ ප්‍රගමණය උදෙසාත්, කෙටි හා දිගු නාට්‍ය කලාවන්හි උන්නතිය උදෙසාත්, නිර්මාණශීලී රසඥතාවෙන් පිරිපුන් ප්‍රඥා සම්පන්න පුරවැසියන් බිහිකිරීම ඉලක්ක කර ගනිමින්, සමස්ත ලංකා පාසල් නාට්‍ය තරගාවලිය සිංහල හා දෙමළ මාධ්‍යයෙන් වාර්ෂිකව දීප ව්‍යාප්තව සංවිධානය කරනු ලැබේ.

මෙම තරගයට ඉදිරිපත්වීමෙන් පාසල් ප්‍රජාව සතු ගායන, වාදන, නර්තන හා රංගන හැකියාවන් මෙන් ම, අනෙකුත් ආනුෂංගික අංශයන්ට සම්බන්ධ නිර්මාණශීලී සෞන්දර්යාත්මක දක්ෂතාවන් ද හඳුනාගැනීමටත්, ශ්‍රී ලාංකේය සිංහල හා දෙමළ සාම්ප්‍රදායික නාට්‍ය අංග පිළිබඳ දැනුම හා අවබෝධය ඔවුන්ට ලබාගැනීමටත් හැකියාවක් සැලසෙන අතර, නාට්‍ය හා රංගකලාවේ අනාගත අභිවෘද්ධියට එය මහෝපකාරී වේ. මේ සඳහා නිරත වන ගුරුභවතුන් සතු නිර්මාණශීලී කෞශල්‍යයෙන් ද මෙම තරගය පෝෂණය වේ.

සමස්ත ලංකා පාසල් නාට්‍ය තරගාවලිය දහස් සංඛ්‍යාත නිර්මාණශීලී දරු දැරියන් දැයට දායාද කිරීමට හඳුන්වා දුන් තරගාවලියකි. 80 දශකයේ සිට මේ දක්වා අඛණ්ඩව සංවිධානය කරනු ලැබූ මෙම තරගාවලිය, ටවර් හෝල් රඟහල පදනම විසින් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යාංශය හා එකාබද්ධව සංවිධානය කරනු ලබයි.

මෙවර මෙම තරගාවලිය සංවිධානය කරනු ලබන්නේ 30 වැනි වරට ය.

**02 අරමුණු:**

2:1 සිංහල හා දෙමළ පාසල් පද්ධතියෙහි නූර්ති හා නාට්‍ය කලාව ප්‍රවර්ධනය කිරීම.
2:2 පාසල් ශිෂ්‍ය ප්‍රජාවගේ නිර්මාණශීලීත්වය, පෞරුෂ වර්ධනය, දැනුම, ආකල්ප හා කුසලතා ප්‍රවර්ධනය කිරීම.
2:3 නිර්මාණශීලී, රසඥතාවයෙන් පිරිපුන්, ප්‍රඥාසම්පන්න ගුණ ගරුක පුරවැසියන් දැයට දායාද කිරීම.
2:4 පළාත් මට්ටමින් ජයග්‍රහණ හිමිකරගන්නා ජයග්‍රාහකයින් සඳහා තිළිණ හා සම්මාන ප්‍රදානෝත්සවයේ දී සහතික පත්‍රයක් පිරිනැමීම හා ඇගයීම.
2:5 ජාතික මට්ටමින් ජයග්‍රහණ හිමිකරගන්නා ජයග්‍රාහකයින් සඳහා තිළිණ, සහතික පත් හා සම්මාන ප්‍රදානය කිරීම හා ඇගයීම.

**03 තරග අංශ:**

3:1 සිංහල මාධ්‍ය පාසල් සඳහා

3:1:1 නෘත්‍ය නාට්‍ය ජවනිකා

3:1:2 කෙටි නාට්‍ය

3:1:3 දිගු නාට්‍ය

3:2 දෙමළ මාධ්‍ය පාසල් සඳහා

3:2:1 ඉසෙ නාඩගම්

3:2:2 කෙටි නාට්‍ය

3:2:3 දිගු නාට්‍ය

**04 තරග කොන්දේසි:**

4:1 නෘත්‍ය නාට්‍ය ජවනිකා අංශය

4:1:1 සිංහල මාධ්‍යයෙන් මෙම නාට්‍ය තරගය පැවැත්වේ.

4:1:2 පහත සඳහන් නිර්දිෂ්ට නූර්ති අතරින් එකක් තෝරා ගනිමින්, සංවාද හා ගීත ඇතුළත් වූ අඛණ්ඩ නාට්‍ය කොටසක් අර්ථහානි නොවන ලෙස නිෂ්පාදනය කළ නෘත්‍ය නාට්‍ය ජවනිකාවක් ඉදිරිපත් කළ යුතු ය.

(අ) නීතිඥ ජෝන් ද සිල්වා සූරීන්ගේ **ශ්‍රී වික්‍රම, සිරිසඟබෝ, වෙස්සන්තර** හා **රාමායණය**

(ආ) චාල්ස් ඩයස් සූරීන්ගේ **විදූර හා පද්මාවතී**

4:1:3 පරිසමාචාරය (Curtain Call) හැර ධාවන කාලය විනාඩි 25-30 අතර විය යුතු ය.

4:1:4 නව රංග උපක්‍රම භාවිත කිරීමට අවකාශ ඇති නමුත්, සාම්ප්‍රදායික ආකෘතිය ආරක්ෂා කර ගනිමින් නිර්මාණ ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

4:1:5 නිෂ්පාදනය සඳහා තෝරාගත් නෘත්‍ය නාට්‍යයෙහි කොටස සහිත පිටපත පළාත් මට්ටමේ දී හා අවසාන වටයේ දී විනිශ්චය මණ්ඩලයට ලබාදිය යුතු ය.

4:2 ඉසෙ නාඩගම් අංශය

4:2:1 දෙමළ මාධ්‍යයෙන් මෙම නාට්‍ය තරගය පැවැත්වේ.

4:2:2 තව තිරු සංග්‍රදාස් ස්වාමිගල් මහතා විසින් රචිත වල්ලි තිරුමනම්, හරිශ්චන්ද්‍ර මයානකාන්ඩම්, සත්‍යවාන් සාවිත්‍රි, පවල කොඩි, අල්ලි අර්ජුනා, පුදත්තම්බි, පක්ද නන්දර්, ඒඑ පිල්ලේ නල්ලතංගාල් යන නිර්දිෂ්ට ග්‍රන්ථ අතරින් එකක් තෝරා ගනිමින්, සංවාද හා ගීත ඇතුළත් වූ අඛණ්ඩ නාට්‍ය කොටසක් අර්ථහානි නොවන ලෙස නිෂ්පාදනය කළ ඉසෙ නාඩගම් ජවනිකාවක් ඉදිරිපත් කළ යුතු ය.

4:2:3 පරිසමාචාරය (Curtain Call) හැර ධාවන කාලය විනාඩි 25-30 අතර විය යුතු ය.

4:2:4 නව රංග උපක්‍රම භාවිත කිරීමට අවකාශ ඇති නමුත්, සාම්ප්‍රදායික ආකෘතිය ආරක්ෂා කර ගනිමින් නිර්මාණ ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

4:2:5 නිෂ්පාදනය සඳහා තෝරාගත් ඉසෙ නාඩගම් කොටස සහිත පිටපත පළාත් මට්ටමේ දී හා අවසාන වටයේ දී විනිශ්චය මණ්ඩලයට ලබාදිය යුතු ය.

4:3 කෙටි නාට්‍ය (සිංහල හා දෙමළ මාධ්‍ය පාසල් සඳහා)

4:3:1 සිංහල හෝ දෙමළ මාධ්‍යයෙන් රචනා කළ, පාසල් සිසු සිසුවියන්ගේ පෞරුෂ වර්ධනයට ඉවහල් වන හා මනසට උචිත, පාසල් පද්ධතියට ගෝචර වන, නිර්මාණශීලී ස්වීය පිටපත් රචනයකින් යුත් නිෂ්පාදනයක් විය යුතු ය. (මෙය ළමා ළමා නාට්‍යයක් නොවිය යුතු ය).

4:3:2 පරිවර්තන හෝ අනුවර්තන ඉදිරිපත් කළ නොහැකි ය.

4:3:3 නව රංග ආකෘති, ශිල්ප ක්‍රම හා තාක්ෂණික ලක්ෂණ භාවිත කළ හැකි ය.

4:3:4 පරිසමාචාරය (Curtain Call) හැර ධාවන කාලය විනාඩි 25-30 විය යුතු ය.

4:3:5 A4 කඩදාසි වල තනි පැත්තේ පමණක් යතුරු ලියනය කළ හෝ පරිගණක අකුරු සංයෝජනය කළ හෝ පැහැදිලි අත් අකුරින් ලියූ නාට්‍ය පිටපත පළාත් මට්ටමේ දී හා අවසාන වටයේ දී විනිශ්චය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

4:4 දිගු නාට්‍ය අංශය

4:4:1 ඉහත 4:3:1, 4:3:2, 4:3:3 හා 4:3:5 මේ සඳහා ද වලංගු ය.

4:4:2 පරිසමාචාරය (Curtain Call) හැර ධාවන කාලය විනාඩි 60-90 අතර විය යුතු ය.

**05 පොදු කොන්දේසි:**

5:1 එක් පාසලකට සියලු ම තරගවලට සහභාගී විය හැකි ය. එසේ වන්නේ නම්, අයදුම් පත්‍රයේ ඡායා පිටපතක් භාවිත කරමින් වෙන් වෙන් වශයෙන් අයදුම් කළ යුතු ය.

5:2 ඕනෑම නිර්මාණයක් සඳහා සහභාගී කරගත හැකි **අවම රංගන ශිල්පීන් සංඛ්‍යාව 03ක්** වන අතර, 40 නොඉක්මවිය යුතු ය. නාට්‍යයට සම්බන්ධ සමස්ත ගුරු සිසු ප්‍රජාව මෙම සංඛ්‍යාවට ඇතුළත් වේ.

5:3 නාට්‍යයකට සම්බන්ධ කරගත හැකි උපරිම ශිල්පීන් සංඛ්‍යාව ඉක්මවා යන්නේ නම්, ඊට **පිළිගත හැකි හේතු ලිඛිතව** ඉදිරිපත් කොට පළාත් වටයේ විනිශ්චයට පෙර ටවර් හෝල් රඟහල පදනමේ අධ්‍යක්ෂ ජනරාල් වෙතින් අනුමැතිය ලබාගත යුතු ය.

5:4 පළාත් වටය සඳහා නාට්‍ය ඉදිරිපත් කිරීමට පෙර අධ්‍යක්ෂක ගුරුභවතා කවර හෝ හේතුවක් මත වෙනත් පාසලකට ස්ථානමාරු වී ඇත්නම් පාසල් දෙකෙහි ම විදුහල්පතිවරුන්ගේ එකඟතාව මත අයදුම්කරු කැමති පාසලකින් තම නාට්‍ය නිර්මාණය ඉදිරිපත් කළ හැකි ය. එහෙත් ඒ පිළිබඳව විදුහල්පතිවරුන් දෙදෙනාගේ ම එකඟතා ලිඛිතව අදාළ විදුහල්පතිවරු මගින් ටවර් හෝල් රඟහල පදනමේ අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතු ය.

5:5 වෙනත් නාට්‍ය තරගයකට ඉදිරිපත් කළ කිසිදු කෙටි හෝ දිගු නාට්‍ය පිටපතක් මෙම තරගයට ඉදිරිපත් නොකළ යුතු අතර, අනුන්ගේ පිටපත් හෝ විකෘති කරන ලද පිටපතක් හෝ වංචනික ලෙස ඉදිරිපත් කර ඇති විටෙක ඒ සම්බන්ධයෙන් අදාළ බලධාරීන්ට දන්වා තරගයෙන් එම නාට්‍යය ඉවත් කිරීමට කටයුතු කරන බැවින්, එවැනි ක්‍රියාවන්ගෙන් සම්පූර්ණයෙන් ම වැළකිය යුතු ය.

5:6 මෙම තරගයට ඉදිරිපත් කරන නාට්‍යයක් වෙනත් තරගයකට ද ඉදිරිපත් කරන්නේ නම්, **එම තරගයට ඉදිරිපත් කිරීමට පෙර** ටවර් හෝල් රඟහල පදනමේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිඛිතව දන්වා ඊට අනුමැතිය ලබාගත යුතු ය.

5:7 **සෑම නාට්‍යයකම අධ්‍යක්ෂවරයා අයදුම්පත ඉදිරිපත් කරන පාසලේ ගුරු භවතෙකු වියයුතු අතර, සහාය අධ්‍යක්ෂවරයා එම පාසලේ ම සිසුවෙකු හෝ සිසුවියක විය යුතු ය. අංගරචනය, සංගීත අධ්‍යක්ෂණය සඳහා පමණක් පාසල පිහිටි පළාතේ වෙනත් පාසලක (පාසල් දෙකෙහි විදුහල්පතිවරුන්ගේ එකඟතාවය මත) ගුරුභවතෙකු හෝ ශිෂ්‍යයෙකු යොදාගත හැක. බාහිර නිර්මාණ ශිල්පීන් මේ සඳහා සහභාගීකරවා නොගත යුතු ය.**

5:8 සෑම තරග මට්ටමකදී ම ලබාදෙනු ලබන දිනයට හා වේලාවට නිශ්චිතව ම තම නාට්‍යය විනිශ්චය සඳහා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂවරයාගේ වගකීම වේ.

5:9 පළාත් මට්ටමේ දී විනිශ්චය සඳහා නාට්‍යය ඉදිරිපත් කළ යුත්තේ අයදුම්පත යොමුකළ පාසලේ දී හෝ නාට්‍ය අධ්‍යක්ෂ විසින් තෝරාගත් වේදිකාවකදී ය. මෙහිදී එම නාට්‍යය මහජන දර්ශනයක් ලෙස ඉදිරිපත් කිරීමට අවකාශ ඇති අතර, එහි දී විනිශ්චය මණ්ඩලය සඳහා ඉදිරිපස ආසන 05ක් වෙන් කළ යුතු ය.

5:10 අවසාන වටයට තෝරාගන්නා නාට්‍ය කොළඹ ටවර් හෝ එල්ෆින්ස්ටන් රඟහලේ දී වේදිකාගත කෙරෙනු ඇත.

5:11 **අයදුම්පත් එවීමෙන් පසු සෑම නාට්‍යයකම නිෂ්පාදන කටයුතු ආරම්භ කළ යුතු ය.**

5:12 ඉහත සඳහන් කොන්දේසි උල්ලංඝනය කළහොත් එම නාට්‍යය ඕනෑ ම අවස්ථාවකදී තරගයෙන් ඉවත් කිරීමේ අයිතිය ටවර් හෝල් රඟහල පදනම සතු ය.

5:13 තරග සංවිධානය, විනිශ්චය මණ්ඩලය පත්කිරීම, විනිශ්චය පිළිබඳ ගැටළු නිරාකරණය, තරග කොන්දේසි උල්ලංඝනය හා සංවිධානය පිළිබඳ සියලු තීරණ ගැනීමේ වගකීම ටවර් හෝල් රඟහල පදනම සතු ය.

5:14 හොඳම නිෂ්පාදනය ප්‍රථම, දෙවන හා තෙවන ස්ථානයන්ට හිමි චෙක්පත් නාට්‍ය ඉදිරිපත් කළ පාසලේ නමට නිකුත් කරනු ලැබේ.

5:15 විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන හා තීරණාත්මක වේ.

## 06 තරගය පැවැත්වෙන ආකාරය:

### 6:1 ප්‍රථම අදියර - අයදුම්පත් කැඳවීම හා එක්දින සම්මන්ත්‍රණය

6:1:1 ටවර් හෝල් රඟහල පදනම, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය හා අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවි මගින් සහ ටවර් හෝල් රඟහල පදනම ප්‍රධාන කාර්යාලයෙන් චක්‍රලේඛ හා අයදුම්පත් ලබාගත හැකි ය.

ටවර් හෝල් රඟහල පදනම - www.towerhall.lk
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය - www.mbs.gov.lk
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යාංශය - www.moe.gov.lk

6:1:2 අයදුම්පත් එවිය යුතු ලිපිනය
**අධ්‍යක්ෂ ජනරාල්, ටවර් හෝල් රඟහල පදනම,**
**සවසිරිපාය, 123, විජේරාම මාවත, කොළඹ 07.**

6:1:3 **අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2025 ජනවාරි 17 වේ.**

6:1:4 සියලු ම නාට්‍ය අධ්‍යක්ෂවරුන්, සහාය අධ්‍යක්ෂවරුන් හා ආනුෂංගික ශිල්පීන් වෙනුවෙන් ඒක්දින සම්මන්ත්‍රණයක් 2025 පෙබරවාරි මස පළමු සතියේ දී පැවැත්වේ.

6:1:5 සියලු ම නාට්‍ය අධ්‍යක්ෂවරුන් හා සහාය අධ්‍යක්ෂවරුන් මෙම සම්මන්ත්‍රණය සඳහා අනිවාර්යෙන්ම සහභාගී විය යුතු ය.

**6:2 දෙවන අදියර - පළාත් වටයේ තරඟ විනිශ්චය**

6:2:1 ප්‍රථම අදියරේ සම්මන්ත්‍රණයට සහභාගී වූ පාසල්හි නාට්‍ය මේ සඳහා සහභාගී කෙරේ.

6:2:2 පළාත් තරඟ විනිශ්චය 2025 මාර්තු/ අප්‍රේල් මාසයන්හි පවත්වනු ලැබේ.

6:2:3 මෙම තරඟයට ඉදිරිපත් වන නාට්‍ය අතරින් අවසාන වටය සඳහා සුදුසුකම් නොලැබූ නාට්‍යයන්හි කුසලතා දැක්වූවන් සඳහා පමණක් සහතික පත්‍රයක් නිකුත් කෙරේ.

6:2:4 තරඟ අංශය 06 යටතේ පළාත් වටයේ උපරිම ලකුණු ලබාගත් සිංහල නාට්‍ය 10 බැගින් හා දෙමළ අංශයේ නාට්‍ය නිර්මාණ10 බැගින් නාට්‍ය නිර්මාණ 60ක් අවසාන වටයට සුදුසුකම් ලබන අතර, පරිපූර්ණ නිෂ්පාදනයක් මෙහිදී අපේක්ෂා කෙරේ.

6:2:5 පිළිගත හැකි හේතුවක් මත මෙම අදියරේ තරඟ විනිශ්චයට ඉදිරිපත් නොවන්නේ නම්, ඒ බැව් විනිශ්චයට දින 07කට පෙර ටවර් හෝල් රඟහල පදනමේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිඛිතව දැන්විය යුතු ය.

**6:3 තෙවැනි අදියර - දෙදින නේවාසික වැඩමුළුව**

6:3:1 අවසාන වටයට තෝරාගත් නාට්‍ය වල නාට්‍ය අධ්‍යක්ෂවරුන් හා සහාය අධ්‍යක්ෂවරුන් සඳහා 2025 මැයි මාසයේ දී මෙම වැඩමුළුව පැවැත්වේ.

6:3:2 පිළිගත හැකි හේතුවක් මත මෙම වැඩමුළුව සඳහා නාට්‍ය අධ්‍යක්ෂකට හෝ සහාය අධ්‍යක්ෂවරයාට සහභාගීවීමට නොහැකි වුවහොත්, ඒ සඳහා නාට්‍යයට සම්බන්ධ වෙනත් ගුරුවරයෙකු හෝ සිසුවෙකු සහභාගී විය යුතු ය. මෙම වැඩමුළුව සහභාගී නොවන නාට්‍ය අවසාන වටයෙන් ඉවත් කෙරේ.

6:3:3 මෙම වැඩමුළුව නාට්‍ය අධ්‍යක්ෂවරයා හා සහාය අධ්‍යක්ෂවරයා වෙනුවෙන් පමණක් ක්‍රියාත්මක කෙරේ.

**6:4 සිව්වැනි අදියර - අවසාන වටය**

6:4:1 මෙම වටය 2025 ජුනි/ ජූලි මාසයන්හි මරදාන ටවර් හෝ එල්ෆින්ස්ටන් යන රංගශාලා දෙකෙන් එකක දී පැවැත්වේ.

6:4:2 මේ සඳහා සහභාගී වන සෑම නාට්‍යයකටම සහභාගීත්ව සහතිකයක් පිරිනැමේ.

6:4:3 මෙම වටය නියෝජනය කරන සෑම නාට්‍යයක් සඳහා ම සහනදායී ප්‍රවාහන දීමනාවක් ද නාට්‍ය අධ්‍යක්ෂ සඳහා රු. 7,500/- ක දීමනාවක් ද ලබාදෙනු ලැබේ.

6:4:4 තරග ඉසව් වලදී පරිසාධක ලකුණු මට්ටම සම්පූර්ණ නොකෙරෙන නිර්මාණ හෝ පුද්ගල දක්ෂතා ප්‍රකට නොවේ නම්, ඊට අදාළ තිළිණ හෝ සම්මාන නිර්දේශ නොකිරීමට විනිශ්චය මණ්ඩලයට හැකි ය.

**6:5 පස්වැනි අදියර - තිළිණ හා සම්මාන ප්‍රදානය**

6:5:1 2025 වසරේ දෙසැම්බර් මස කොළඹ දී උත්සවාකරයෙන් පැවැත්වේ.

6:5:2 මෙම උත්සවය සඳහා සිසු සිසුවියන් පාසල් නිළ ඇඳුමින් හා ගුරු භවතුන් උත්සවයේ ගෞරවය ආරක්ෂා වන පරිදි සුදුසු ඇඳුමකින් සැරසී පැමිණීම අනිවාර්ය වේ.

6:5:3 මුදල් ත්‍යාගවලට අමතරව සම්මාන හා සහතික ප්‍රදානය කෙරේ.

6:5:4 ප්‍රධාන තිළිණ හා සම්මානවලට අමතරව ජූරියේ ඇගයීම් වෙතොත් ඒ සඳහා ද තිළිණ හා සම්මාන පිරිනැමේ.

**07 තිළිණ හා සම්මාන ප්‍රදානය:**

| තරග ඉසව්ව | නූර්ති ජවනිකා (සිංහල මාධ්‍ය) ඉසෛ නාඩගම් (දෙමළ මාධ්‍ය) | කෙටි නාට්‍ය (සිංහල හා දෙමළ) | දිගු නාට්‍ය (සිංහල හා දෙමළ) |
|---|---|---|---|
| හොඳම සංගීත අධ්‍යක්ෂණය | රු. 15,000.00 | රු. 15,000.00 | රු. 15,000.00 |
| හොඳම වේදිකා පසුතල නිර්මාණය | රු. 15,000.00 | රු. 15,000.00 | රු. 15,000.00 |
| හොඳම රංගවස්ත්‍ර නිර්මාණය | රු. 15,000.00 | රු. 15,000.00 | රු. 15,000.00 |
| හොඳම අංග රචනය | රු. 15,000.00 | රු. 15,000.00 | රු. 15,000.00 |
| හොඳම රංග වින්‍යාසය | රු. 15,000.00 | රු. 15,000.00 | රු. 15,000.00 |
| හොඳම සහාය රංගනය (නිළි) | රු. 10,000.00 | රු. 10,000.00 | රු. 10,000.00 |
| හොඳම සහාය රංගනය (නළු) | රු. 10,000.00 | රු. 10,000.00 | රු. 10,000.00 |
| හොඳම රංගනය (නිළි) | රු. 15,000.00 | රු. 15,000.00 | රු. 15,000.00 |
| හොඳම රංගනය (නළු) | රු. 15,000.00 | රු. 15,000.00 | රු. 15,000.00 |
| හොඳම පිටපත 3 වන ස්ථානය | - | රු.10,000.00 | රු. 15,000.00 |
| හොඳම පිටපත 2 වන ස්ථානය | - | රු. 15,000.00 | රු. 20,000.00 |
| වසරේ හොඳම පිටපත | - | රු. 20,000.00 | රු. 25,000.00 |
| වසරේ හොඳම අධ්‍යක්ෂණය | රු. 15,000.00 | රු. 15,000.00 | රු. 20,000.00 |
| වසරේ හොඳම සහාය අධ්‍යක්ෂණය | රු. 10,000.00 | රු. 10,000.00 | රු. 10,000.00 |
| හොඳම නිෂ්පාදනය 3 වන ස්ථානය | රු. 20,000.00 | රු. 10,000.00 | රු. 20,000.00 |
| හොඳම නිෂ්පාදනය 2 වන ස්ථානය | රු. 25,000.00 | රු. 15,000.00 | රු. 25,000.00 |
| හොඳම නිෂ්පාදනය 1 වන ස්ථානය | රු. 30,000.00 | රු. 20,000.00 | රු. 30,000.00 |

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය හා ටවර් හෝල් රඟහල පදනම ඒකාබද්ධ ව සංවිධානය කරනු ලබන මෙම නූර්ති හා නාට්‍ය තරගාවලිය සාර්ථක කර ගැනීමට ඔබ දක්වනු ලබන සහයෝගය අතිශයින් ම අගයමි.

නාලක කලුවැව
ලේකම්